# මාධ්‍යාවලෝකන

මාධ්‍ය නිරීක්ෂණ වැඩසටහන




ඡායාරූප : Associated Press

# 13 වැනි සංශෝධනය

## ඉන්දීය විදේශ ඇමති කළ ප්‍රකාශය සහ සිංහල, දෙමළ මුල් පිටු

ඉන්දීය විදේශ කටයුතු ඇමති එස්. එම්. ක්‍රිෂ්ණා මහතා නිළ සංචාරයක් සඳහා 2012 ජනවාරි 16 වන දින ශ්‍රී ලංකාවට පැමිණියේ ය. විශේෂයෙන්ම, ඉන්දීය විදේශ ඇමතිවරයාගේ නිල සම්ප්‍රාප්තිය සිදු වූයේ ශ්‍රී ලංකාවේ විශේෂ දේශපාලන මොහොතකදී ය. එනම්, ලංකාවේ දෙමළ ජාතීන්ගේ දේශපාලන ගැටලුවට සහ එහි සන්නද්ධ නැගීටීමට හේතු වූ කරුණු සොයා බැලීමටත් විශේෂයෙන්ම, සටන් විරාම ගිවිසුමේ සිට 2009 මැයි මාසයේ යුධ අවසානය දක්වා කාලයේ දි සිදු වූ  යුධමය අකටයුතුකම් (යුද්ධය නිසා එයට මැදි වූ ජනතාවට සිදු වූ අසාධාරණකම්) පිළිබඳව කරුණු සොයාබැලීමටත් පත් කළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසන් සභාවේ වාර්තාව යම් පමණකට හෝ සමාජයේ සාකච්ඡාවකට ලක් වෙමින් තිබෙන මොහොතක ය. එසේම, එම වාර්තාව සම්බන්ධයෙන් දෙමළ ජාතික සංධානය සිය ස්ථාවරය පිටු 100කට අධික වාර්තාවකින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති දේශපාලනික වට පිටාවක් තුළ ය.

කෙසේනමුත්, ක්‍රිෂ්ණා ඇමතිවරයා සහ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා අතර ඇති විය හැකි සාකච්ඡාවේ ස්වාභාවය පිළිබදව යම් ඉඟි පෙර සිටම දේශපාලනික සමාජයෙන් මතු වුවත්, එහි තීරණාත්මක ලක්ෂණ පිළිබදව ලාංකීය පාඨකයාට දැන ගැනීමට ලැබුණේ 2012 ජනවාරි 18 වනදා ය. එනම්, මෙදින පළ

වූ පුවත්පත් ආශ්‍රයෙනි. ඒ, ප්‍රධාන වශයෙන් ඉන්දීය විදේශ ඇමතිවරයා සහ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා අතර වුණු සාකච්ඡාවල මූලික පදනම වූ ලංකාවේ ජාතික ගැටලුව හා බැඳුණු කරුණු නිසා ය.

ඉන්දීය විදේශ කටයුතු ඇමති එස්. එම්. ක්‍රිෂ්ණා මහතා 2012 ජනවාරි මස 17 වැනි දින කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වනු ලැබී ය. මෙය දේශපාලනිකව ඉතා වැදගත් සාකච්ඡාවක් වුවද ලාංකීය ප්‍රධාන ධාරාවේ සිංහල හා දෙමළ පුවත්පත් එය වාර්තා කළ සැටි හැමදාමත් මෙන් අරුම පුදුමය.

මෙම පසුබිම තුළ පිහිටා සිට, ඉහත ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන ක්‍රිෂ්ණා මහතා ප්‍රකාශ කර තිබූ කරුණු පිළිබඳව ''මුල් පිටුවේ පුවත්පත් වාර්තාකරණය පමණක්'' මෙවර ''මාධ්‍යාවලෝකන'' උදෙසා නිරීක්ෂණයට භාජනය කර ඇත. එනම්, ජනවාරි 18 වැනි දින සිංහල සහ දෙමළ දිනපතා පුවත්පත්වල මුල් පිටුවේ පළ වූ ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳව පමණක් මෙහිදී විශ්ලේෂණය කර ඇත.

## සිංහල පෞද්ගලික පුවත්පත්

### ලක්බිම


ලක්බිම

දෙමළ ජනතා ගැටලුවලට විසඳුම් ලැබෙන

13 සංශෝධනයෙන් ඔබ්බට යාමට ශ්‍රී ලංකා රජය එකඟ වුණා

ඉන්දීය විදේශ ඇමැති කියයි

13 වැනි සංශෝධනය පිළිබඳව ශ්‍රී ලංකා රජයේ නව ස්ථාවරය දක්වෙන එක් ප්‍රධාන ප්‍රවෘත්තියක් (Lead News) ක්‍රිෂ්ණා මහතාව උපුටා දක්වමින් ''දිනපතා ලක්බිම'' පුවත්පත පමණක් මෙදින පළ කර ඇත. එය මෙසේ ශීර්ෂ ගන්වා තිබිණි.

''දෙමළ ජනතා ගැටලුවලට විසඳුම් ලැබෙන, 13 සංශෝධනයෙන් ඔබ්බට යාමට ශ්‍රී ලංකා රජය එකඟ වුණා: ඉන්දීය විදේශ ඇමති කියයි''

ක්‍රිෂ්ණා මහතා ප්‍රකාශ කර ඇති වැදගත් කරුණු කිහිපයක් ඉහත ප්‍රධාන ප්‍රවෘත්තිය තුළ පහත පරිදි වාර්තාකර ඇත.

- ද්‍රවිඩ ජනතාවගේ ගැටලුවලට නිසි පිළිතුරු සැපයෙන විධිමත් දේශපාලන විසඳුමක් ශ්‍රී ලංකා රජය මගින් ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ.
- 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට ගිය දේශපාලන විසඳුමක් සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මේ වන විටත් 'එකඟතාවය' පළකර ඇත.
- විධිමත් බලය විමධ්‍යගත කරලීමේ ක්‍රියාවලියක් වෙත යොමුවීම සඳහා තමා සමග (ක්‍රිෂ්ණා සමග) පැවැති සාකච්ඡාවේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා 'එකඟතාවය' පළ කර ඇත.
- LLRC වාර්තාවේ සාධනීය නිර්දේශ රැසක් අඩංගු වන අතර එම නිර්දේශ ක්‍රියාත්මක කරලීම, මෙරට තුළ ජාතික ඒකාබද්ධතාවය හා සංහිඳියාව ගොඩනැගීම සඳහා ඉවහල් වේ.
- ද්‍රවිඩ ජාතික සන්ධානය සමග පැවැත්වෙන සාකච්ඡා අඛණ්ඩව විසඳුමක් කරා ගෙන ඒමට ශ්‍රී ලංකා රජය උත්සහ ගැනීම ඉතා වැදගත් වේ.

### ලංකාදීප

එමෙන්ම, ඉන්දීය විදේශ ඇමති උක්ත ප්‍රවෘත්ති සාකච්ඡාවේදී සඳහන් කළ කරුණු පිළිබඳව ''දිනපතා ලංකාදීප'' පුවත්පත ද මුල් පිටුවේ එක් ප්‍රවෘත්තියක් (ප්‍රධාන පුවතක් නොවේ) පළ කර ඇත. එය මෙසේ වාර්තා වේ.

''දහතුන් වැනි සංශෝධනයෙන් එහා යන දේශපාලන විසඳුමක්: ජනපති පොරොන්දු වීයැයි ඉන්දීය විදේශ ඇමති කියයි''

ලංකාදීප පුවත්පත වාර්තා කරන්නේ 13 වැනි සංශෝධනයට එහා ගිය දේශපාලන විසඳුමක් දෙමළ ජනතාවට ලබා දෙන බවට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඉන්දීය විදේශ ඇමතිවරයාට ''පොරෝන්දු වී''



දහතුන් වැනි සංශෝධනයෙන් එහා යන දේශපාලන විසඳුමක්

ජනපති පොරොන්දු වීයැයි ඉන්දීය විදේශ ඇමැති කියයි

කිහිපයක් ඉන්දීය විදේශ ඇමතිවරයා ප්‍රකාශ කර ඇති බව මෙම 'ලංකාදීප' ප්‍රවෘත්තිය වාර්තා කර ඇත. එනම්,

- යුධ ගැටුම් අවසන් කිරීමට නායකත්වය හා දක්ම සැපයූ ආකාරයටම ස්ථාවර දේශපාලන සංහිඳියාවක් ඇති කිරීමට දැන් කාලය එළඹ ඇත.
- මෙම ගැටලුව විසඳීමට ගන්නා ක්‍රියාමාර්ග ගැන ඉන්දියාව හැම විටම අවධානයෙන් ඉන්නවා.

ඇති බවයි. නමුත්, මෙම ප්‍රකාශය පිළිබඳව ඉහත 'ලක්බිම' ප්‍රවෘත්තියේ සඳහන්ව ඇත්තේ 13න් ඔබ්බට ගිය විසඳුමක් සඳහා ''එකඟතාවය'' පළකර ඇති බවය.

'ලංකාදීප' තවදුරටත් පවසන්නේ, මෙවැනි විසඳුමක් ලබාදීම සඳහා කැපවීමකින් කටයුතු කරන බවට ජනාධිපතිවරයා තමාට ප්‍රකාශ කළ බව විදේශ ඇමතිවරයා මාධ්‍ය හමුවේදී පැවැසූ බවයි. ඉහත සඳහන් කළ ''ලක්බිම ප්‍රධාන ප්‍රවෘත්තියේ'' පළ නොවූ අදහස්

- 13 වැනි සංශෝධනයෙන් දේශපාලන විසඳුමක් ලබා දීමට ශ්‍රී ලංකා රජය කැපවී ක්‍රියාකරන බව අවස්ථා කිහිපයකදීම සඳහන්කර තිබුණා.
- රජය හා දෙමළ ජාතික සන්ධානය අතර පවතින සංවාදය පාර්ලිමේන්තු තේරීම් කාරක කමිටුවේ මගපෙන්වීම යටතේ දේශපාලන විසඳුමක් කරා යොමු වනු ඇති බව අපි විශ්වාස කරනවා.

## දිවයින

මීට අමතරව, ඉන්දීය විදේශ ඇමතිගේ ප්‍රවෘත්ති සාකච්ඡාව පිළිබඳව ''දිනපතා දිවයින'' පුවත්පත් ද



'13' සම්පූර්ණයෙන් බලගන්වන්න සූදානම් යැයි ජනපති කීවා

ඉන්දීය විදේශ ඇමැති කියයි

එක් මුල් පිටුවේ ප්‍රවෘත්තියක් පළ කර ඇති අතර එය පළ කර ඇත්තේ පහත සඳහන් පරිදිය.

''13 සම්පූර්ණයෙන් බලගන්වන්න සූදානම් යැයි ජනපති කීවා: ඉන්දීය විදේශ ඇමති කියයි''

ඉන්දීය විදේශ ඇමතිවරයා මෙම ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ''දෙමළ ගැටලුව විසඳීම සඳහා දේශපාලන විසඳුමක අවශ්‍යතාව ඇතැයි ද 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය බෙදාහැරීම සුදුසු බවද'' ප්‍රකාශ කර ඇති බව දිවයින මෙම ප්‍රවෘත්තියෙන් වාර්තාකර ඇත. එමෙන්ම, මහින්ද රාජපක්ෂ මහතා සහ ක්‍රිෂ්ණා මහතා අතර ජනවාරි 17 වැනි දින පෙරවරුවේදී විනාඩි 90ක පමණ කාලයක් දෙමළ ජනතාවගේ ගැටලු විසඳීම පිළිබඳව සාකච්ඡා පවත්වා ඇති බවද 'දිවයින' මෙම ප්‍රවෘත්තියෙන් වාර්තා කර ඇත.

# දෙමළ පෞද්ගලික පුවත්පත්

සුඩර් ඔළි පුවත්පත, ඉන්දීය විදේශ ඇමතිවරයා කොළඹ දී පැවතී ප්‍රවෘත්ති සාකච්ඡාවේදී 13 වැනි සංශෝධනයට අදාලව සිදු කර ඇති ප්‍රකාශයන් උපුටා දක්වමින් තම මුල් ප්‍රවෘත්තිය (Lead News) වාර්තා කර ඇත. මෙහි ශීර්ෂ පාඨය යොදාගෙන ඇත්තේ ''13 සංශෝධනයෙන් ඔබ්බට යාමට සූදානම්: ඇමති ක්‍රිෂ්ණාට ජනපති එකඟ වෙයි'' යනුවෙන් වාර්තා කිරීම සඳහා ය. ක්‍රිෂ්ණා මහතා ප්‍රකාශ කළ බව මෙහි දක්වෙන සුවිශේෂ කරුණු කිහිපයක් මෙසේ ය.

- ශ්‍රී ලංකාවේ රජය සහ TNA සමග පැවැත්වෙන සාකච්ඡා තුළින් මෙන්ම, පාර්ලිමේන්තු තේරීම් කාරක සභා නිර්දේශ මගින් යහපත් දේශපාලන විසඳුමක් කරා ගමන් කළ හැකි බව විශ්වාස කරනවා.
- LLRC වාර්තාවේ තිබෙන ඉතාමත් සාධනීය නිර්දේශ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා රජය ගොඩනගමින් යන ජාතික ඒකාබද්ධතාවයට ඉතාමත් වැදගත් පියවරක් ලෙස සඳහන් කළ




හැකියි.

වීරකේසරී සහ තිනක්කුරල් පුවත්පත් ද මේ හා සමාන ප්‍රධාන පුවත් (Lead News) වාර්තාකරණයක් සිදු කර ඇති බව නිරීක්ෂණය කළ හැකිය. වීරකේසරී පුවත්පත මෙම මුල් පිටුවේ වර්ණ ඡායාරූප දෙකක්ද සමගින් මුල් පිටුවේ සහ 'ඉතිරිය' දක්වෙන දහවන පිටුව තුළ වඩා වැඩි ඉඩ ප්‍රමාණයක් වෙන් කරමින් මෙම ප්‍රවෘත්තිය වාර්තාකර ඇත.

තිනක්කුරල් පුවත්පත, 13 වැනි සංශෝධනය පිළිබඳව ක්‍රිෂ්ණා මහතා කර තිබූ ප්‍රකාශ පමණක් අළලා තම ප්‍රධාන ප්‍රවෘත්තිය පළ කර ඇත. ඒ මහතා මෙම ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී පවසා තිබූ LLRC වාර්තාවේ තිබෙන ඉතාමත් සාධනීය නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව, ධීවර ගැටලු සම්බන්ධ විසඳුම්, සංවර්ධන කටයුතු, උතුරේ නිවාස ව්‍යාපෘතිය සහ අවබෝධතා ගිවිසුම් යනාදී කරුණු පිළිබඳව මුල් පිටුවේ වෙනත් ප්‍රවෘත්තියක් තුළ වාර්තා කර ඇත.

# රජයේ පුවත්පත්

## දිනමිණ පුවත්පත

මෙදින (ජනවාරි 18) ''දිනමිණ පුවත්පත'' ද ඉන්දීය විදේශ ඇමතිවරයාගේ ප්‍රවෘත්ති සාකච්ඡාව පිළිබඳව තම ප්‍රධාන ප්‍රවෘත්තිය (Lead New) වාර්තාකර ඇත. මෙම මුල් ප්‍රවෘත්තියේ මුල් පිටුවට අදාල කොටසේ කිසිදු තැනක 13 වැනි සංශෝධනයට අදාලව ඉන්දීය




විදේශ ඇමතිවරයා කර ඇති කිසිදු ප්‍රකාශයක් සඳහන් වන්නේ නැත. මෙම ප්‍රධාන ප්‍රවෘත්තියෙන් වැඩි වශයෙන් අවධාරණය කර ඇත්තේ LLRC වාර්තාවේ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවට ක්‍රිෂ්ණා මහතා මාධ්‍ය හමුවේදී කළ ප්‍රකාශය පිළිබඳවයි. මීට අමතරව මෙම ප්‍රධාන ප්‍රවෘත්තියෙන් අවධානය යොමු කර ඇත්තේ,

1. ඉන්දු ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් බව පැවසීමට,
2. රජය හා ටීඑන්ඒ සාකච්ඡා හොඳ ප්‍රවේශයක් පව කීමට,
3. ඉන්දු-ශ්‍රී ලංකා අවබෝධතා ගිවිසුම් පිළිබඳව කීමට සහ
4. ධීවර ගැටලුවලට සාකච්ඡාමය විසඳුම් ලබා දුන් බව කීමට වැනි කරුණු වාර්තා කිරීම සඳහා ය. එමෙන්ම, මෙදින දිනමිණ මුල් පිටුවේ මහින්ද රාජපක්ෂ මහතා සහ එස්. එම්. ක්‍රිෂ්ණා මහතා අතිනත අල්ලාගෙන සිටින අයුරු දක්වෙන වර්ණ ඡායාරූපයක් ද දක්වේ. මෙහි එන ප්‍රධාන ශීර්ෂ පාඨය මෙසේය.

''ඉන්දු-ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත්, රජය-TNA සාකච්ඡා හොඳ ප්‍රවේශයක්, ධීවර ගැටලුවට සාකච්ඡාමය විසඳුම්, උගත් පාඩම් කොමිසමේ නිර්දේශ කඩිනමින් ක්‍රියාවට නංවන්නඃ ඉන්දීය විදේශ ලේකම් මාධ්‍ය හමුවේ දී කියයි''

මෙම ශීර්ෂ පාඨය තුළ ඉන්දීය විදේශ ඇමතිවරයාව ''ඉන්දීය විදේශ ලේකම්'' ලෙසින් හඳුන්වා දී ඇත. නමුත්, මෙම ප්‍රවෘත්තියේ අන්තර්ගතය තුළ දක්වෙන්නේ එස්. එම්. ක්‍රිෂ්ණා යනු ''ඉන්දීය විදේශ කටයුතු ඇමති'' ලෙසිනි.

''13 වැනි සංශෝධනය සම්බන්ධව, ඉන්දීය විදේශ ඇමතිවරයා මෙම මාධ්‍ය හමුවේ දී සඳහන් කළා යැයි

දැක්වෙන එක් කරුණක් පිළිබඳව එක් වාක්‍යයක් තුළ පමණක් සඳහන් කර ඇත. එම වාක්‍යය පළ කර ඇත්තේ ද මෙම මුල් ප්‍රවෘත්තියේ 'ඉතිරිය' දැක්වෙන හතරවැනි පිටුවේය. එම කොටස ප්‍රවෘත්තියේ අවසන් ඡේදයට කලින් ඡේදය තුළ පළ කර තිබීමද සුවිශේෂිත ය. එම වාක්‍යය පහත පරිදි මෙසේ උපුටා දැක්විය හැකි ය.

''මේ අතර ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හමුවී සාර්ථක සාකච්ඡාවක නිරතවූ බව සඳහන් කළ ක්‍රිෂ්ණා මහතා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වඩා ඉදිරියට ගිය සංශෝධනයක් වෙනුවෙන් අදහස් පළ කළ බවද කීවේ ය''

මෙම වාක්‍යය, කලින් දැක්වුණු ප්‍රවෘත්ති වාර්තා සමග සංසන්ධනය කිරීමේ දි පැහැදිලි අදහසක් ගෙන නොදෙන වාක්‍යයක් ලෙස සඳහන් කළ හැකි වේ. මෙම වාක්‍ය තුළ '13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වඩා ඉදිරියට ගිය සංශෝධනයක් වෙනුවෙන් අදහස් පළ කළ බව' යනුවෙන් සඳහන් කර තිබීම මගින් මෙම වාක්‍යයේ අපැහැදිලිතාවය පෙන්නුම් කර තිබේ. මෙම අදහස අනෙකුත් සිංහල පුවත්පත් වාර්තා කර තිබුණේ ''13 සංශෝධනයෙන් ඔබ්බට, දහතුන් වැනි සංශෝධනයෙන් එහා යන, 13 සම්පූර්ණයෙන් බලගන්වන'' යනාදි යෙදුම් භාවිතා කරමිනි.

## තිනකරන් පුවත්පත


13වது திருத்தத்திற்கும் மேலதிகமாக தீர்வை வழங்க தயாரென ஜனாதிபதி தெரிவிப்பு

ஜனாதிபதி தெரிவித்த உறுதிமொழிக்கு கிருஷ்ணா பாராட்டு

- இலங்கை - இந்தியா 5 ஒப்பந்தங்கள் கைச்சாத்து
- நல்லிணக்க ஆணைக்குழு அறிக்கைக்கு இந்தியா வரவேற்பு
- இனப்பிரச்சினைக்கு தீர்வு காண தெரிவுக்குழு சிறந்த மேடை

ඉහත පෞද්ගලික දෙමළ පුවත්පත් තුනේ පළ වූ මුල් ප්‍රවෘත්තීන්හි '13 සංශෝධනයෙන් ඔබ්බට, එයින් එහා ගිය' වැනි අරුත් දනවන දෙමළ වචනයක් භාවිතා කරමින් එම ප්‍රවෘත්තිය වාර්තා කර ඇති මුත්, රජයේ ''තිනකරන්'' පුවත්පතේ දැක්වෙන ප්‍රධාන ප්‍රවෘත්තිය තුළ සඳහන් කර ඇත්තේ ''13 වැනි සංශෝධනයට වඩා වැඩි (ටිකක් එහා ගිය වැනි අරුතක් මෙහිදී ලබා දේ) විසඳුමක් ලබාදෙන බව ජනපති කියයි'' යනුවෙනි.

ඒ අනුව, මෙම මුල් ප්‍රවෘත්තිය මගින් අවධාරණය කරන්නේ, 13 වැනි සංශෝධනයට වඩා වැඩි දෙයක් ගැන සාකච්ඡාකර හොඳ තීරණයක් ගමු, යනුවෙන් තමා වෙත (ඉන්දීය විදේශ ඇමති වෙත) ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කළ බවයි.

මීට අමතරව මෙම ප්‍රධාන ප්‍රවෘත්තිය තුළ වැඩි වශයෙන් අවධාරණාත්මක ලෙස කරුණු තුනක් සඳහන් කර ඇත. එනම්,

- ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගිවිසුම් පහක් අත්සන් කරයි.
- ප්‍රතිසමාධාන කොමිසන් වාර්තාව ඉන්දීය රජය අගය කරයි.
- ජාතික ප්‍රශ්නය විසඳාලීමට පාර්ලිමේන්තු කාරක සභාව වඩා උචිත වේදිකාවක්.

## විශේෂ සටහන




**'දිණමින', ඇමති ලේකම් කිරීම**

පුවත් පතකට හෝ කවර මාධ්‍යකට වැරදීම් සිදුවිය හැකි නමුත් සම්ප්‍රදාය වන්නේ ඊළඟ කලාපයේ හෝ ඊළඟ සටහනේ එය නිවැරදි කර පළ කිරීමයි. ඉහතින් දක්වා ඇති පරිදි රජයේ මාධ්‍ය වාර්තාකරණයෙහි 'දිනමිණ පුවත්පත' තුළ ඉන්දීය විදේශ කටයුතු ඇමතිව ''ඉන්දීය විදේශ ලෙකම්'' ලෙසින් නිවැරදි නොවන ලෙස සඳහන් කර ඇත. අත් වැරදීමකින් හෝ වෙන යම් දෝෂයක් නිසාවෙන් එය එසේ සිදු විය හැකිව තිබුන ද පසු සටහනකදී එය නිවැරදී කළ යුතුව තිබිණි. නමුත්, 'දිණමින' පුවත්පතට එසේ නිවැරදී කිරීමේ අවශ්‍යතාවයක් 2012 ජනවාරි 19, 20 හා 21 යන දිනයන් වලදී වත් නොතිබූ බව සඳහන් කළ යුතුව ඇත.

# ජනමාධ්‍යයේ යුතුකම් හා අභිලාෂ

ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් සම්පාදනය කරනු ලැබ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් පිළිගැනුණු මාධ්‍ය වෘත්තිය ප්‍රතිපත්ති සංග්‍රහයේ එන ''පූර්විකාවේ'' සඳහන්, නිරවද්‍ය වාර්තාකරණය, ගවේෂණාත්මක වාර්තාකරණය, මාධ්‍යවේදින්ගේ සමාජ වගකීම්සහගතභාවය, කරුණු දැන ගැනීමේ පොදුජන අයිතිය ආරක්ෂා කිරීම හා පොදුජන සුභසිද්ධිය යනාදි මාධ්‍ය ආචාර ධාර්මික කොටස් කිහිපයක් සහ මෙම ප්‍රතිපත්ති සංග්‍රහයෙන් පිළිගැනුණු දෙවෙනි හා පස්වෙනි මාධ්‍ය වෘත්තීය ප්‍රතිපත්තීන් මෙසේ උපුටා දැක්විය හැකි ය.

### "1. පූර්විකාව

''මාධ්‍ය නිදහසට එරෙහිව ක්‍රියාත්මකවන විකෘති වාණිජත්වයෙන් හෝ පටු ආත්මාර්ථයේ අනිසි බලපෑමෙන්ද නිර්බාධකව නිරවද්‍යතාව හා වෘත්තීය අව්‍යාජත්වය උදෙසා දරන ප්‍රයත්නයද පොදු ජන සුබ සිද්ධිය සඳහා ගවේෂණාත්මක පුවත්පත් කලාවේ උසස්තම සම්ප්‍රදාය සහතික කිරිමද මේ මාධ්‍ය වෘත්තීය ප්‍රතිපත්ති සංග්‍රහයෙන් ප්‍රයත්න දැරේ. සිය ප්‍රබල මත දැරිමේ හා ප්‍රකාශයට පත් කිරීමේ නිදහස පුවත්පතටත් පුවත්පත් කලාවේදින්ටත්/වේදිනියන්ටත් හිමි වන අතරම අන්‍යන්ගේ අදහස් කෙරෙහි නිසි සැලැකිලි දැක්වීමටත් සමාජය කෙරෙහි සිය වගකීම් පිළිබිඹු කිරීමේ උත්සාහයක යෙදීමටත් පුවත්පත් හා පුවත්පත් කාලාවේදීහු වගබලා ගත යුත්තෝය.

මේ මාධ්‍ය වෘත්තීය ප්‍රතිපත්ති මාලාව, පුද්ගලයාගේ අයිතිය මෙන්ම කරුණු දැන ගැනීමට පොදු ජනතාවට ඇති අයිතියද ආරක්ෂා කරයි. ඒ අයිතිය ප්‍රකාශනයෙන් මෙන්ම හරයෙන්ද සම්පූර්ණයෙන්ම ආරක්ෂා විය යුතු අතරම පුද්ගල අයිතිය කෙරෙහි දැක්වෙන ගෞරවයට අදාළව එහි අන්තර්ගත වගකීම අන්කිසිවකට හිලවු වන තරමට පටු අන්දමින් හෝ පොදුජන සුබසිද්ධිය උදෙසා කැරෙන ප්‍රකාශය වැළැකෙන තරමට පුළුල්ව හෝ නිර්වචනය නොවිය යුත්තේය.''

### "2. නිරවද්‍ය වාර්තාකරණය

2.1 නිවැරදිවත් විකෘතියකින් තොරවත් ප්‍රවෘත්ති වාර්තා කිරීම හා ඡායාරූප කළ කිරීම සඳහා මාධ්‍යය සාධාරණ පරෙස්සමකින් ක්‍රියා කළ යුත්තේය.

2.2 වාර්තාවල නිරවද්‍යතාව, එය පළ කැරෙන්නට කලින් සොයා බැලිම සඳහා කර්තෘවරුන් ඒ ඒ පුවත්පත් කලාවේදියෝත් සෑම සාධාරණ ප්‍රයත්නයක්ම දැරිය යුත්තෝය. එවැනි සොයා බැලීමක් ප්‍රායෝගිකව නොකළ හැකි අවස්ථාවකදී ඒ බව වාර්තාවේ සඳහන්කළ යුතුය.

2.3 කර්තෘවරුන්/වරියන්, බාහිරව ලිපි සැපයීමෙහි යෙදෙන ලේඛකයන්/ලේඛිකාවන් ඇතුළු කාර්ය මණ්ඩලයත් අසත්‍ය හෝ නිවැරදි නොවන බව තමන් දන්නා වූද එසේයැයි විශ්වාස කිරීමට තමන්ට හේතු ඇත්තාවූද කිසිදු කරුණක් තහවුරුවන අන්දමින් පළ නොකළ යුත්තේය.

2.4 පොදු ජන සුබ සිද්ධිය සඳහා ගවේෂණාත්මක පුවත්පත් කලාවෙහි නියැලෙන ලෙස ප්‍රකාශන දිරිමත් කැරේ.''

### "3. නිවැරැදි කිරීම් හා සමා අයැදීම

3.1 වාර්තාවක් කරුණු අතින් වැරැදියැයි කර්තෘට පෙනී යන අවස්ථාවකදී එය නිසි ප්‍රමුඛතාවක් හා යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක්ද ඇතිව, එම නිවැරැදි කිරීම හා සමා අයැදීම පීඩිත පාර්ශවයේ කැමැත්තට පටහැනි වන අවස්ථාවකදී හැර, අනෙක් හැම විටෙකදීම වහාම නිවැරදි කළ යුත්තේය.''

**"මාධ්‍යවලෝකන" පිළිබඳව ඔබගේ අදහස්, මතවාද හා විවේචන අප වෙත එවන්න.**

ඊමේල් : media@cpalanka.org
දුරකථන අංක : 011-2375239, 011-2375012
ෆැක්ස් අංකය : 011-2375239

පිවිසෙන්න/විමසන්න/ ලියන්න
www.vikalpa.org
www.youtube.com/vikalpasl
www.flickr.com/photos/vikalpasl
email - info@vikalpa.org
Editor - Sampath Samarakoon
sampath@cpalanka.org, editor@vikalpa.org